**ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) උප වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ 1.6.1(ආ) ඡේදයේ ඇතුළත් නිරීක්ෂණ අනුව පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම් ලැබීම

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවේ 3.2.2 රාජ්‍ය ආදායම - බදු නොවන ආදායම්හි, ආදායම් සංකේත 20.02.01.01 ප්‍රකාරව රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී මූලික ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 1400 ලෙස දක්වා තිබුණි. නමුත් මූල්‍ය ප්‍රකාශනවල ආදායම් ප්‍රකාශයේ මූලික ඇස්තමේන්තුව රු. මිලියන 925 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. මිලියන 475ක් එනම් සියයට 51.35කින් ආදායම් ඇස්තමේන්තුව අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශවල දැක්විය යුතු බව | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශය දැනුවත් කිරීමකින් තොරව සියයට 50 කට වඩා වැඩියෙන් ආදායම් ඇස්තමේන්තුව වැඩිකර තිබුණි. |

## 1.6.2 සීමා ඉක්මවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ උපරිම වියදම් සීමාව රු.16,989,178 කින් ඉක්මවා තිබුණු අතර, උපරිම හර ශේෂ සීමාවද රු. 50,402,471 කින් ඉක්මවා තිබුණි. තවද අවම ලැබීම් සීමාව රු. 25,106,021කින් වැඩිවී තිබුණි. සීමා සංශෝධන සම්බන්ධයෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 503 ප්‍රකාරව කටයුතු කළ යුතු බව | 2019 වර්ෂයට අදාල අත්තිකාරම් 'බී' ගිණුමට අදාල සීමාවන් ගණනයේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ආපදා කළමනාකරණ අංශය ඇතුලත් නොකරමින් කටයුතු කර ඇත. මේ පිළිබඳව සීමාවන් වැඩිකිරීමට අදාල කැබිනට් පත්‍රිකාව රාජ්‍ය පරිපාලන අමාත්‍යතුමන්ගේ අත්සනින් යුතුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යවනු ලැබූ අතර ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ BD/AA/130/13001/2019 දරණ 2019.08.28 දිනැති ලිපිය මඟින් අත්තිකාරම් 'බී' ගිණුමෙහි සීමාවන් සංශෝධනය කිරීමට කටයුතු කරන ලදී. |

## 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ඇප ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වා ගත යුතු බව | මුදල් රෙගුලාසි 891 අනුව ඇප අයකිරීම් සම්බන්ධව ප්‍රායෝගික ගැටළු ඇති බැවින්, ඇප ලේඛනය යාවත්කාලීන නොකරන ලද අතර මේ සම්බන්ධව භාණ්ඩාගාරයෙන් අවශ්‍ය උපදෙස් ලබාගෙන ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

## 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | <br>අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ) 1951 අංක 14 දරන මෝටර් වාහන ආඥා පනතේ 151(2) හා 151(3) වගන්ති** | 2019 වර්ෂයේ අමාත්‍යාංශයේ සිදුව තිබූ වාහන අනතුරු 8 න් 6 ක් ම අමාත්‍යවරයාගේ කාර්යාලයට හා කාර්ය මණ්ඩලය වෙත ලබා දී තිබූ වාහන නොසැලකිලිමත් සහ අධික වේගයෙන් ධාවනය හේතුවෙන් සිදුව තිබුණි. එම අලාභයන්ගේ එකතුව රු.3,550,083 ක් විය. | අපරීක්ෂාකාරීව හෝ අන්තරාදායක ලෙස මහාමාර්ගය පාවිච්චි කරන තැනැත්තන් සම්බන්ධයෙන් විධිමත් පියවර ගත යුතු වීම | අදහස් දක්වා නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදය** | | | |
| (i) 4.1 වගන්තිය | දීර්ඝ පොරොත්තු ලේඛනයක් පැවතියද එක් සමුළු නිවාසයක් වර්ෂ 27කට පෙර සිට හා තවත් නිවසක් 2001 වර්ෂයේ සිට මාසිකව පිළිවෙලින් රු.275ක සහ රු. 1,000ක | පොදු නිවාස උපලේඛනගත නිවාස වෙන් කර දීම සම්බන්ධයෙන් විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව | අමප/1991/116 (70) දරණ 1991.10.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් 23C සමුළු නිවාසය රු.275ක නාමික කුලියක් අයකිරීමට අනුමැතිය ලැබී ඇත.<br>ඉහත අමාත්‍ය මණ්ඩල |

| | | | |
|---|---|---|---|
| | කුලියකට ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයට ලබා දී තිබුණි. | | තීරණයම සැලකිල්ලට ගනිමින්, එවකට සිටි අමාත්‍යාංශ ලේකම් විසින් 26 සී සමුළු නිවස 2001.02.02 දින සිට රු.1000ක නාමික කුලියක් අයකිරීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය වෙත වෙන් කරදී ඇත. |
| **(ii) 5.2.1 වගන්තිය** | 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා රජයේ නිල නිවාසවලින් කුලි ලෙස අය විය යුතුව තිබූ රු. 64,653,051 ක මුදල අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | විවාහක නිලධාරියෙකුගේ මාසික වැටුපෙන් සියයට 12.5ක් ද, අවිවාහක නිලධාරියෙකුගේ මාසික වැටුපෙන් සියයට 7.5 ක් වශයෙන් අයකර ගත යුතු හිඟ කුලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු බව | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත වෙන්කර දී තිබූ බංගලා 02 සඳහා රු.36,042,000 ක කුලියෙන්, අතීතයට බලපැවැත්වෙන පරිදි තක්සේරු කර එවන ලද වාර්තා මත පදනම්ව ගණනය කරන ලද හිඟ මුදල වන රු. 13,614,000 කඩිනමින් ගෙවීමට එකඟ විය. ඉතිරි මුදල වන රු. 22,428,000 වටිනාකම හැකි ඉක්මනින් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. අනෙකුත් හිඟ කුලිය අය කර ගැනීමට ද නිරන්තර දැනුම් දීම් සිදුකර ඇත. ජයවඩනගම නිවාස සංකීර්ණයේ නිවාසවලට අදාල හිඟ නිවාස කුලී ආදායමින් රු. 8,755,182.56 ක මුදල අත්හැරීමට අනුමැතිය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට යවන ලදී. |
| **(iii) 6.1 වගන්තිය** | මැති ඇමතිවරුන් 14 ක් ද රාජ්‍ය නිළධාරීන් 14 ක් ද විගණිත දිනය වන 2020 ජුලි 22 වන විට අනවසරයෙන් රජයේ | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළයුතු බව | නිළධාරීන් 6 දෙනෙකු සඳහා නීති කටයුතු ආරම්භ කර ඇති අතර තවත් නිළධාරීන් 7 දෙනෙකු සඳහා නිවාස භාර දෙන |

| | | | |
|---|---|---|---|
| | නිවාසවල පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය. | | ලෙස ලිපි මඟින් දන්වා ඇත. එක් නිළධාරියෙකු සඳහා අස් කිරීමේ නිවේදන යොමු කර ඇත. අමාත්‍යවරුන් 8 දෙනෙකු සඳහා අස්කිරීමේ නිවේදන යොමු කර ඇති අතර 6 දෙනෙකු සඳහා නිවාස භාර දෙන ලෙස ලිපි මඟින් දැනුම් දී ඇත. |
| **(ඇ) 2018 ජනවාරි 24 දිනැති අංක 02 / 2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | මානව සම්පත් සැලැස්මට අනුව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර තිබිය යුතු නමුත් 2019 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළයුතු බව | 2018/2019 වර්ෂ දෙකම සඳහා එක් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර ඇති අතර පෙන්වා දී ඇති කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමුකර, 2020 වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 ආදායම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ 05 ක හිඟහිටි ආදායමේ වාර්ෂික අයවීම සියයට 22 කට වඩා අඩු ප්‍රතිශතයක් විය. එමෙන්ම හිඟහිටි ආදායමෙන් රු.146,803,677 ක් 2016 දෙසැම්බර් 31 දිනට පෙර පැවති ශේෂය වූ අතර, එය මුළු | හිඟහිටි ආදායම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු බව | 2017.01.01 දිනෙන් පසු වාර්තා වී ඇති හිඟ ආදායමෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අයකර ගෙන ඇති නමුත් අපේක්ෂිත පරිදි විවිධ හේතූන් මත කුලී අයකරගත නොහැකි වී ඇත. 2016 දෙසැම්බර් 31 දිනට පෙර ආයතන 14 කට අදාලව පැවති රු. 146,803,677 ක ශේෂය අයකර ගැනීමට අසීරු වී ඇත. අදාල ආයතන |

| | | | |
|---|---|---|---|
| | හිඟහිටි ආදායමෙන් සියයට 59 ක ප්‍රතිශතයක් විය. | | දැනටමත් දැනුවත් කර ඇති අතර ඉදිරියේදී හිඟ ආදායම් අයකර ගැනීමට අපේක්ෂිතය. |
| (ආ) | 2019 ජනවාරි 01 දිනට හිඟ ආදායම් ශේෂය, 2018 ජනවාරි 01 දිනට සාපේක්ෂව රු.54,437,902 කින් එනම් සියයට 29 කින් වැඩි වී තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු බව | 2018 වර්ෂයට අදාලව වාර්තා වී ඇති හිඟ ආදායමට සාපේක්ෂව අය කරගැනීමට හැකිවූ ආදායම අඩුවිය. තවද 2019.01.01 දිනට හිඟ ආදායම් ශේෂය තුල 2018 වර්ෂයට පෙර වර්ෂයන්හි වාර්තා නොවූ රු.28,550,028 ක හිඟ ආදායම ඇතුලත් වී ඇති අතර මෙම හිඟ ආදායම කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් 2019 වර්ෂය අවසානයේදී රු. 93,379,479 ක ආදායමක් අයවිය යුතුව පැවති අතර, මෙම හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන දැනුවත් කර ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු බව | 2019 වර්ෂයේදී හිඟ ආදායම වන රු.84,815,474 මුදලින් රු.20,361,820 ක මුදලක් අය කරගෙන ඇත. 2019.12.31 දිනට රු.93,379,479 හිඟ මුදලක් තිබීමට හේතුවී ඇත්තේ ගිවිසුම් ප්‍රකාර කුලී මුදල් ගෙවීම පැහැර හැරීම වන අතර හිඟ කුලී අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විටත් ආරම්භ කර ඇත. |
| (ඈ) | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ලේ 2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා අයවිය යුතු හිඟකුලී රු. 33,465,869 ක් අයකර ගත නොහැකි බව තහවුරු කරගෙන ඇතත්, අවශ්‍ය අනුමැතිය ලබාගෙන ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | දීර්ඝ කාලීනව අය නොවන බැවින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු බව | ආයතන හතර සම්බන්ධව අයකිරීමට නොහැකි රු. 33,465,869 ක මුළු හිඟ මුදල පොත්වලින් ඉවත් කිරීමට භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති අතර මේ වනවිට භාණ්ඩාගාර අනුමැතිය නොලැබුණද ඉදිරියේදී භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඉ) | නිදන්ගත වකුගඩු රෝග වැලැක්වීමේ හා පර්යේෂණ ලේකම් කාර්යාලයට ලබා දී තිබූ රජයේ නිවාසයේ 2017 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ආදායම් ශේෂය රු.6,450,000 ක් වන අතර 2018 දෙසැම්බර් | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව | 2015 වර්ෂයේ සිට අයවිය යුතු හිඟ කුලී මුදල් නිරවුල් කරන ලෙස කිහිපවරක් ලිඛිතව දැනුම් දී ඇතත්, මේ වන තෙක් එම හිඟ මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොමැත. |

31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ හිඟ හිටි ශේෂයක් දක්වා නොතිබුණි. එසේ වුවද, 2019 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ශේෂය වශයෙන් ගිණුම්ගත කර ඇත්තේ 2017 වර්ෂය දක්වා හිඟහිටි මුදල සහ සමාලෝචිත වර්ෂයේ කුලී වශයෙන් රු.9,510,000ක් පමණි.

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ඇස්තමේන්තුව සහ මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් මඟින් පුනරාවර්තන වැය විෂයයක් සඳහා සලසා තිබූ ප්‍රතිපාදන රු.10,140,000ක් අදාළ කාර්යයට යොදා නොගෙන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු බව | නිරීක්ෂණය සමඟ එකඟවේ. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 15 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.118,335,000 ක් වූ අතර මුළු වියදම රු. 93,786,592 ක් වූයෙන් මුළු ඉතිරිවීම් ප්‍රමාණය රු. 24,548,408 ක් විය. එම ඉතිරිය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 15ක සිට සියයට 60 ක් අතර පරාසයක් ගෙන තිබුණි. | -එම- | නිරීක්ෂණය සමඟ එකඟවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රතිපාදන මුදල් වර්ෂය තුළ වියදම් කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව සහ ප්‍රතිපාදන ඉක්මවා යෑමට ඉඩකඩ ඇති බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා සෑහීමකට පත් වූ විට පමණක් මු.රෙ. 66 ප්‍රකාරව මුදල් මාරු කල හැකි වුව ද එම තත්ත්වයන් සැලකිල්ලට නොගෙන අවස්ථා 14 කදී වෙනත් වැය විෂයයන්ගෙන් ප්‍රතිපාදන මාරුකරගෙන සියයට 35 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ඉතිරි වීම් නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු බව | නිරීක්ෂණය සමඟ එකඟවේ. |
| (ඈ) | 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන චක්‍රලේඛය අනුව ප්‍රාග්ධන වියදම්වලින් සියයට 25ක් අනිවාර්ය ඉතිරි කිරීම් සිදුකරන ලෙස දන්වා ඇතත්, වැය විෂයයයන් 31 ක් සම්බන්ධයෙන් සියයට 10ක් පමණක් ඉතිරි කර තිබුණි. | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු බව | නිරීක්ෂණය සමඟ එකඟවේ. |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>------------------------ | නිර්දේශය<br>------------ | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------- |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර මුද්‍රිත අනුව පුනරාවර්තන වැය විෂයයන් 34ක බැරකම්වල වටිනාකම රු.30,604,603 ක් වුවද, 2019 මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.17,685,619 ක් වූයෙන් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් සහ මූල්‍ය ප්‍රකාශන රු.16,779,208 කින් නොසැසඳුණි. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව නිවැරදි කිරීමට කටයුතු කළ යුතු බව | මෙම වෙනස සිගාස් වැඩසටහනෙහි සිදුව ඇති තාක්ෂණික දෝෂයක් වන අතර එය 2020 ජුනි මස තුල රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතින් නිරවුල් කරගැනීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මූලධන වැය විෂයයන් 08 කට අදාළ බැරකම්වල වටිනාකම රු.318,763,582 ක් වූ අතර 2019 මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.191,540,521 ක් වූයෙන් භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් සහ මූල්‍ය ප්‍රකාශන රු.127,223,061 කින් නොසැසඳුණි. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව නිවැරදි කිරීමට කටයුතු කළ යුතු බව | මෙම වෙනස සිගාස් වැඩසටහනෙහි සිදුව ඇති තාක්ෂණික දෝෂයක් වන අතර එය 2020 ජුනි මස තුල රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතින් නිරවුල් කරගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මුදල් රෙගුලාසි 216 (අ) විධිවිධානවලට පටහැනිව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු.1,635,300 ක බැරකම් සඳහා එකග වී තිබුණි. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව | රාජ්‍ය පරිපාලන අංශයට අදාල වන වැයවිෂයන් 08 ක් යටතේ ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණු මුදල රු. 1,338,749 පමණකි. ජාතික එලදායීතා ලේකම් කාර්යාලයට අදාල වැයවිෂයන් 04 ක් යටතේ ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණු මුදල රු. 322,710 කි. 2019 වර්ෂයට අදාලව 2020 වර්ෂයේදී ඉදිරිපත් කර තිබූ වවුචර්පත් වෙනුවෙන් 2019 වර්ෂයේ ඉතිරි ප්‍රතිපාදනයෙන් ප්‍රමාණවත් බව නොසලකා ගෙවීම් කටයුතු සිදුකර ඇති අතර ඉදිරියේදී එබඳු ගෙවීම් වළක්වා ගැනීමට අවශ්‍ය කටයුතු ගෙන ඇත. |
| (ඈ) | 2020 වර්ෂයේ ගෙවීම් වවුචර් පිළිබඳ නියදි විගණන පරීක්ෂාවේදි අනාවරණය වූ 2019 වර්ෂයට අදාළ රු.52,794,951 ක බැරකම් 12 ක් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සියළුම බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කල යුතු බව | 2019 වර්ෂයට අදාළ සමහර ගෙවීම් වවුචර් ඉදිරිපත් වූයේ බැරකම් ලේඛනය සකස් කර අවසාන වීමෙන් පසුවය. එම ගෙවීම් පැහැර හැරීමට නොහැකි බැවින් ගෙවීම් කිරීමට සිදුවූ අතර ඉදිරියේදී අදාළ අංශ දැනුවත් කර එම ප්‍රමාද දෝෂයන් මගහරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

## 2.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සේවය හැර ගිය, විශ්‍රාම ගිය හා ද්වීතියන පදනම මත මුදා හැර ඇති නිළධාරීන්ගෙන් අයවිය යුතු රු. 1,293,671 ක ණය ශේෂයක් වර්ෂ 01ක් සිට වර්ෂ 04ක කාලයක් දක්වා හිඟහිටිව පැවතුණි. | අයකරගත යුතු ණය ශේෂයන් කාලීනව අයකරගත යුතු බව | නිලධාරින් 4 දෙනෙකු සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගැනිමට නිතිපති දෙපාර්තමේන්තුවේ ලිපි ගොනු විවෘත කර ඇත. නිළධාරීන් 4 දෙනෙකුගේ ශේෂ පියවන ලෙස ලිපි මගින් දැනුම් දී ඇත. නිළධාරීන් දෙදෙනෙකුගෙන් මාසිකව ණය ශේෂ අයවන අතර මියගිය නිලධාරියකුගේ ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට ද එක් නිළධාරියකුගේ ණය ශේෂය ඇපකරු මඟින් අයකර ගැනීමට ද කටයුතු කරනු ලැබේ. ද්වීතියික පදනම මත මුදාහැර ඇති නිලධාරීන්ගේ ණය ශේෂ, මාසික වාරික ලෙස අයවන අතර අවුරුදු 4 ක් ඉක්මවූ රු.392,775 ණය ශේෂ අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2.5 අධිහාර කිරීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දීප ව්‍යාප්ත සේවා නිලධාරීන් 30 දෙනෙකු සඳහා 2019 වර්ෂයේ පෙබරවාරි 20 සිට 25 තෙක් විදේශ පුහුණු පාඨමාලාවකට සහභාගිවීම වෙනුවෙන් ගෙවූ පාඨමාලා ගාස්තුව තුල රාත්‍රි ආහාර වියදම ඇතුළත්ව ඇති බව දක්වා තිබුණි. එසේ තිබියදී 2015 මැයි 15 දිනැති අංක MF/01/ 2015/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 (ආ) (1) වගන්තියට අනුකූල නොවන ලෙස රාත්‍රි ආහාර වියදම සඳහා ගෙවන ලද රු. 2,033,450 ක් ආපසු අයකරගත යුතු වුවත් අය කර ගෙන තිබුණේ රු. 326,250ක් පමණි. | මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු බව | අතිරේකව ගෙවන ලද මුදල අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු සිදු කරනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් 05ක් තුල නිල පියස නිවාස ඉදිකිරීම 2017 වර්ෂයේ දී ආරම්භ කර 2019 වර්ෂයේ දී අවසන් කිරීමට සැලසුම් කර තිබුණද එම කටයුතු 2020 අගෝස්තු වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි ඉදිකිරිම් නිමකිරීමට කටයුතු කළ යුතු බව | අදහස් දක්වා නොමැත. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුල ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III ශ්‍රේණියේ නිළධාරීන් 360 ක් සඳහා ධාරිතා වර්ධන වැඩසටහනක් සැලසුම් කර තිබුණද ඒ සඳහා නිළධාරීන් 67ක් පමණක් සහභාගි වී තිබුණි. එය සියයට 19ක අඩු ප්‍රතිශතයක් විය. | සැලසුම් කළ පරිදි උපරිම කාර්යසාධනය ක් සහිතව කාර්යයන් ඉටු කළ යුතු බව | අදහස් දක්වා නොමැත. |
| (ඇ) ඒකාබද්ධ සේවා අංශය විසින් වර්ෂය තුල බඳවා ගැනීමේ විභාග 6ක් සහ කාර්යක්ෂමතා කඩඉම් විභාග 30ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද එම විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | -එම- | අදහස් දක්වා නොමැත. |

**3.2** **ප්‍රසම්පාදනයන්**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>**----------------------** | | **නිර්දේශය**<br>**-----------** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>**-------------------------------** |
|---|---|---|---|
| (අ) | 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය අනුව ඉදිරි වර්ෂ 3ක කාලය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු බව | අදහස් දක්වා නොතිබුණි. |
| (ආ) | 2019 ජුනි මාසයේදී රුසියාවේ පැවති ප්‍රදර්ශනයක් සඳහා අමාත්‍යවරයා සහභාගී වීමේදී ලබාගත් ගුවන් ටිකට්පත් සඳහා රු. 324,975 ක වැඩි මිලක් ගෙවා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 මාර්ගෝපදේශයෙන් බැහැරව එම ගෙවීම් සඳහා අනුමැතිය ලබා දී තිබුණි. | -එම- | අමාත්‍යවරයාගේ විදේශ ගමන් සඳහා ගුවන් සේවාවක් තෝරා ගැනීමේ දී එහි ආරක්ෂිත බව, කාර්යක්ෂම බව කිසියම් සේවාව හා සුදුසු පංතිය ගැන සැලකිලිමත් විය යුතුය. තවද ලෝකයේ ගුවන් ගමන් සේවා පෙලගැස්ම අනුව Qatar Airways පළමු තැන පවතින අතර, Gulf Air පවතින්නේ ඉතා පහළ ස්ථානයකයි. ඒ අනුව Qatar Airways තෝරා ගෙන ඇත. |

**3.3** **පාඩු හා හානි**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>**----------------------** | | **නිර්දේශය**<br>**----------** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>**--------------------------------** |
|---|---|---|---|
| ( අ) | ප්‍රාරම්භක පරීක්ෂණ අවස්ථාවේ අනතුරෙහි අලාභහානිය හඳුනාගෙන හානි පාඩු ලේඛණයට ඇතුළත් කළ යුතු වුවද, එසේ සටහන් කර නොතිබූ බැවින් පාඩුව හෝ හානිය සම්බන්ධයෙන් යම් අයකර ගැනීමක්, කපාහැරීමක් කළ යුතුද යන්න තහවුරු කරගත නොහැකි විය. | මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව කටයුතු කළයුතු බව | අලුත්වැඩියාව සඳහා යොදාගන්නා අමතර කොටස් සඳහා රක්ෂණ ආයතනය විසින් වරින් වර අනුමැතිය ලබාදෙන බැවින්, අනතුරු සම්බන්ධයෙන් සකස් කරන ප්‍රාරම්භක වාර්තාවේ අලාභහානිය සඳහා වන වටිනාකම නිශ්චිතව සඳහන් |

| | | |
|---|---|---|
| (ආ) හදිසි අනතුරක් සම්බන්ධයෙන්, එහි ගමන් කළ නිළධාරීන් හෝ රියදුරන් විසින් ළඟම ඇති පොලීසියට වාර්තා කරවීමට වග බලා ගත යුතුය. එසේ වුවද රු. 2,700,000 ක අලාභ හානි වූ අනතුරක් සම්බන්ධයෙන් පොලිසියට වාර්තා කර නොතිබූ අතර අනතුරු 5ක් සම්බන්ධයෙන් රියදුරු පොලිසියට පැමිණිලි කිරීමේ දී රක්ෂණාවරනය ලබා ගැනීමට සිදුකරන පැමිණිල්ලක් පමණක් වන බවට ප්‍රකාශයන් කර තිබුණි. | මුදල් රෙගුලාසි 1642 ප්‍රකාරව කටයුතු කළ යුතු බව | කිරීමට හැකියාවක් නොපවතී. අනතුරක් සිදුවූ විට ක්‍රියා කළ යුතු ආකාරය සදහන් ලිපියක් ද රියදුරු මහතුන් වෙත ලබා දී ඇත. |

## 3.4 කළමනාකරණ දූර්වලතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිළධාරීන් 49ක් විශේෂ ශ්‍රේණියේ ප්‍රධාන මූල්‍ය නිළධාරී තනතුරු සඳහා සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පූර්ණකාලීනව වැඩ බැලීම සඳහා පත් කර තිබූණි. | විශේෂ ශ්‍රේණියට උසස් කිරිමේ කටයුතු සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරින් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ කටයුතු උසාවි නියෝගයක් හේතුවෙන් 2016.11.29 දින සිට අත්හිටුවා ඇති බැවින් පුරප්පාඩු වන ප්‍රධාන මූල්‍ය නිලධාරි තනතුරු සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරින් ජ්‍යෙෂ්ඨත්වය අනුව පූර්ණ කාලීනව වැඩ බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. ඉහත නඩු කටයුත්ත අවසන් වීමෙන් පසුව, විශේෂ ශ්‍රේණියට උසස් කිරිමේ කටයුතු සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැඩ බැලීම සඳහා පත් කරනු ලබන ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිළධාරීන් 06 දෙනෙකුගේ වැඩ බැලීමේ වැටුප් ගෙවීමේ නියැදි පරීක්ෂාවට අනුව නිළධාරීන් 03 දෙනෙකු සඳහා වැටුප් වර්ධක 02ක් මූලික වැටුපට එකතු කර හා 03 දෙනෙකුට වැටුප් වර්ධක 02ක් දීමනාවක් ලෙස ගෙවා තිබුණි. එසේම පෞද්ගලික ලිපිගොනු 26 ක් තුළ වැටුප් පරිවර්තන අන්තර්ගත නොවුණි. | ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12.5.2 උපවගන්තිය ප්‍රකාරව වැඩ බලන තනතුරේ වැටුප ගණනයට අනුව කටයුතු කළ යුතු බව | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිළධාරීන්ගේ වැටුප් ගෙවීමේ කටයුතු අදාල අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන්ගේ විෂය පථයට අයත් කාර්යයභාරයක් වන අතර, එම තත්වය නිවැරදි කිරීම සඳහා අදාල අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදි ගන්නා බව කාරුණිකව දන්වමි. |
| (ඇ) | 2007 දෙසැම්බර් 31 දිනැති අංක 21/2007(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් සහිත විදේශ නිවාඩු ලබා දීමේදී නිලධාරියා අයත් සේවාවට අදාළ පරිපාලන බලධාරියා වෙත වාර්තා කළ යුතුය. එසේ වුවද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරියෙකු සම්බන්ධයෙන් අදාළ පරිපාලන නිලධාරියා වන රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වාර්තා නොකර 2019 අගෝස්තු සිට 2022 ජූලි දක්වා විදේශ නිවාඩු ලබා දී තිබුණි.<br>තවද, රජයේ නිල නිවාස ලබා දීමේදී අත්සන් කරනු ලබන ගිවිසුම් පත්‍රයේ 02 ඡේදය ප්‍රකාරව මාස 12 ඉක්මවන කාලයකට විදේශගත වන නිළධාරියෙකු රජයේ නිවාස වෙන්කරනු ලැබීම සඳහා නුසුදුස්සකු වන නමුත් උක්ත නිළධාරියා විගණිත දිනය වන 2020 ජූලි මස 30 දින දක්වාම නිවාසය ආපසු භාරදී නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව | ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවා ව්‍යවස්ථාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරිමේ දී අදාළ ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම ප්‍රමාණවත් අතර තව දුරටත් ආචාර්ය උපාධියක් හැදෑරීම සිදු කරන්නේ නම් ඒ සඳහා ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 16 වන වගන්ති ප්‍රකාරව වැටුප් රහිත නිවාඩු ලබා දීමේ හැකියාව ඇති නමුත් ආචාර්ය උපාධිය සඳහා විදේශගතවීමට අනුමැතිය ලබා දීමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ. මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදි ගන්නා බව කාරුණිකව දන්වමි. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1792 , තථ්‍ය කාර්ය මණ්ඩලය 1409 ක් හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය 383 ක් විය. සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය පුද්ගලික පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 1,079.7ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 766,306ක් වී තිබුණි. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා වූ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු බව | පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. |

**ආපදා කළමණාකරන අංශය**

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 විගණනයට සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පාඩු හා අත්හැරිම් පිළිබඳ ප්‍රකාශනයේ වැඩසටහන් අංක 02 යටතේ වර්ෂය තුල අලාභ අය කර ගැනීම/කපාහැරිම/අත්හැරිම පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබු රු.50,062 ක වටිනාකම හානි පාඩු ලේඛණයට ඇතුලත් කර ඉදිරිපත් කර නොතිබුණි. | හානි පාඩු ලේඛනයේ ඇතුලත් කළ යුතු බව | අදහස් දක්වා නොමැත. |

**1.6.2 නීති රීති හා රෙගුලාසිවලට අනුකුල නොවීම.**

| නිරීක්ෂණය<br>නිති රීති රෙගුලාසිවලට යොමුව | අනුකුල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ. 1645 | - ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ වාහන 06 ක ලොග් පොත් සම්පූර්ණ කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 1645 ප්‍රකාරව වාහන ලොග් පොත් සම්පූර්ණ කළ යුතු බව | අදාළ වාහන සම්බන්ධ ලොග් පොත් සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) මු.රෙ 1647 (ආ) (ඉ) | - ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ වාහන සහ ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ | මුදල් රෙගුලාසි 1647 ප්‍රකාරව කටයුතු කර වාහන | මුදල් රෙගුලාසි අංක 1647 (ආ) සහ 1647 (ඉ) ප්‍රකාරව වාහන පිළිබඳ තොරතුරු ඇතුලත් කර ලැයිස්තුවක් |

| | | | |
|---|---|---|---|
| | පරීක්ෂාවක් කර විස්තර ඇතුලත් ලැයිස්තුවක් සකස් කර නොතිබුණි. | ලැයිස්තුවක් පිළියෙල කළ යුතු බව | සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) පොදු 268 (අ) - ආකෘති පත්‍රය | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ වාහන සම්බන්ධයෙන් පොදු ආකෘතිය ප්‍රකාරව සකස් කරන මාසික සාරාංශයේ මුල් පිටපත් ඊළඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු නොතිබුණි. | සාරාංශවල මුල් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු බව | වර්ෂයට අදාළව 268 (අ) වැනි පොදු ආකෘති පත්‍ර ප්‍රකාරව ගමන් පිළිබඳ මාසික සාරාංශවල මුල් පිටපත් ආයතන ප්‍රධානියා මාර්ගයෙන් විගණකාධිපති වෙතට යොමු කර අවසන් කර ඇත . |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමණාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ඇස්තමේන්තු කිරීමේ දුර්වලතාවයන් හෝ කාර්යයන් නිසි පරිදි සැලසුම් නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 04ක් සඳහා මුල් ඇස්තමේන්තුවෙන් සලසා තිබූ රු.මිලියන 200 කට අමතරව සහ පරිපූරක මගින් රු.මිලියන 2,782ක ප්‍රතිපාදන සලසා ගෙන සියයට 81 ක සිට සියයට 100 ක අතර පරාසයක් ඉතිරිකර තිබුණි. තවද පුනරාවර්තන වැය විෂයයක් සඳහා මුල් ඇස්තමේන්තුවෙන් සලසා තිබූ රු. මිලියන 200 කට අමතරව පරිපූරක මගින් රු. මිලියන 439 ක ප්‍රතිපාදන සලසා ගෙන සියයට 99 ක් ඉතිරිකර තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව සකස් කර ප්‍රතිපාදන උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතු බව | ප්‍රමාණවත් අක්මුදල් නොමැති විම. ඇස්තමේන්තු කළ අපේක්ෂිත වියදම් ඇති නොවිම. |
| (ආ) ප්‍රාග්ධන වැය විෂයයන් 07 කට අදාළව මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.2,141,700,000 ක් සම්බන්ධයෙන් මුළු වියදම රු. 1,066,266,557 ක් වූයෙන් ඉතිරිවීම් රු. 1,075,433,443 ක් විය. එය සියයට 33ක සිට සියයට 100ක් අතර පරාසයක් තුල පැවතිණි. | -එම- | ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඇති වූ ගැටලු මත ප්‍රසම්පාදන කිහිපයක් සිදු කිරිමට නොහැකි විම. |

| | | |
|---|---|---|
| (ඇ) පුනරාවර්තන වැය විෂයයන් 05 කට අදාළව මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.10,620,000 ක් සම්බන්ධයෙන් මුළු වියදම රු. 913,649 ක් විය. ඒ අනුව ඉතිරිවීම් රු. 9,706,351 ක් වූයෙන් එය සියයට 35ක සිට සියයට 100 ත් අතර පරාසයක් තුල පැවතුණි. | -එම- | අක්මුදල් නොමැතිවීම හා අපේක්ෂිත වියදම් ඇති නොවීම. සාමාජික මුදල් නොගෙවීම, අපේක්ෂිත නිලධාරීන් බඳවා ගැනීමට නොහැකිවීම හේතුවෙන් ඇතිවූ අනියම් ඉතිරිවීම් |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 216(අ) වගන්තියට පටහැනිව වැය විෂයයන් 05ක ඉතිරිය ඉක්මවා රු.2,195,549ක බැරකම්වලට බැඳී තිබුණි. | වැය විෂයයන්ගේ ඉතිරිය ඉක්මවා බැරකම්වලට නොඑළඹිය යුතු බව | 2019 දෙසැම්බර් මස බිල්පත් 2020 මුල් මාස කිහිපය තුල ගෙවීම සඳහා ඉදිරිපත් කිරීම හේතුවෙන් මෙම වියදම් ඇති වී ඇත. |
| (ආ)2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව පුනරාවර්තන වැය විෂයයන් 17කට අදාළ බැරකම් වටිනාකම රු.265,731,227 ක් වු අතර, 2019 මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එම වටිනාකම රු.271,990,789 ක් වූයෙන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සහ මූල්‍ය ප්‍රකාශන රු.6,259,562 කින් නොසැසඳුණි. | මූල්‍ය ප්‍රකාශනවල බැරකම් වටිනාකම නිවැරදිව දැක්විය යුතු බව | වෙනස සිගාස් වැඩසටහනේ සිදුව ඇති තාක්ෂණික දෝෂයක් වන අතර එය 2020 ජුනි මස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතින් නිරවුල් කර ගැනිමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ)2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව ප්‍රාග්ධන වැය විෂයයන් 09 කට අදාළ බැරකම්වල වටිනාකම රු.713,892,017 ක් වු අතර, 2019 මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.406,406,820 ක් වූයෙන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සහ මූල්‍ය ප්‍රකාශන රු.307,485,197 කින් නොසැසඳුණි. | බැරකම් වටිනාකම නිවැරදිව දැක්විය යුතු බව | වෙනස සිගාස් වැඩසටහනේ සිදුව ඇති තාක්ෂණික දෝෂයක් වන අතර එය 2020 ජුනි මස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතින් නිරවුල් කර ගැනිමට කටයුතු කරනු ලැබේ. |

**2.3 අත්තිකාරම් ගිණුම් ශේෂ**

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 02 කට පෙර විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.117,552 ක් වු ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් නිරවුල් කර නොතිබුණි. | ණය ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතු බව | හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වන මෙම නිලධාරියා අවුරුදු 60 සම්පූර්ණ විම මත විශ්‍රාම ගොස් ඇති අතර 2019.05.11 දින මියගොස් ඇති බැවින් නොගෙවු විශ්‍රාම වැටුප හා පාරිතෝෂිතයෙන් ඔහුගේ උරුමකරුවන්ට හිමි මුදලෙන් අයකර ගැනිමේ කටයුතු සිදු කරමින් පවති. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 කාර්යභාරයන් ඉටුනොකිරීම**

----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මාතලේ දිස්ත්‍රික්කයේ අවදානම් කලාපවල ජීවත්වන පවුල් 800 කින් 740 ක් සඳහාද, ගලේවෙල හා අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශවල අවදානම් කලාපවල ජීවත්වන කිසිදු පවුලකටද ප්‍රතිලාභ ලබාදී නොතිබුණි. අනෙකුත් ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ 06 හි ප්‍රතිලාභ ලබාදීම්වල භෞතික ප්‍රගතිය සියයට 6 ක සිට සියයට 13 දක්වා ඉතා අවම මට්ටමක පැවතුණි. 2019 වර්ෂයට අදාළව මාතලේ දිස්ත්‍රික්කයට ලබාදී තිබු රු.59,791,800 ක ප්‍රතිපාදන මුදලින් රු.22,216,800 ක් පමණක් උපයෝජනය කර තිබු බැවින් සමස්ථයක් ලෙස දිස්ත්‍රික්කයේ ප්‍රතිපාදන උපයෝජනය සියයට 37 ක් විය. | අවදානම් කලාපවල ජීවත්වන පවුල් සඳහා ප්‍රතිලාභ නොපමාව ලබා දිය යුතු බව | විගණන විමසුම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් පිළිතුරු ගෙන්වා ගැනිමට හැකියාවක් නොතිබුණි. |

**3.2 ප්‍රසම්පාදනයන්**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | -------------- | ------------------------------------ |
| (අ) ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ ප්‍රසම්පාදන සැලැස්ම තුල 5KW ජෙනරේටර් සඳහා ඇස්තමේන්තුව රු.6,500,000 ක් වුවද 3KW ජෙනරේටර් 250ක් රු.18,176,038 කට මිලදී ගෙන තිබුණ බැවින් ඇස්තමේන්තු ගත වියදමට වඩා රු.11,676,038 ක් හෙවත් සියයට 179.63 ක් ගෙවා තිබුණි. | සැලැස්මට අනුකූලව ඇස්තමේන්තු නිසියාකාරව පිළියෙල කළ යුතු බව | ඇස්තමේන්තු සකස් කිරීමේදී දූරකථනයෙන් මිල ගණන් විමසීම සිදුකිරීම නිසා වෙළඳපොල වටිනාකම වැරදි ලෙස අවබෝධ කරගෙන ඇති බැවින් මෙම දුර්වලතාවය පැන නැගී ඇත. ඉදිරියේදී මේ පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ. |
| (ආ) ආපදා සහන සේවා මධ්‍යස්ථානය ලීටර් 1000 ජල ටැංකි 1000 ක් මිලදීගෙන බෙදා හැරීමට සැලසුම් කර තිබුණද, නියමිත කාලය තුල ප්‍රසම්පාදනයන් නොකිරීම හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් ප්‍රසම්පාදන කටයුතු සිදු කර මිලදී ගැනිමට සිදු විම නිසා ආපදා කළමනාකරණ අංශයේ මිලට වඩා රු.560,232 ක් වැඩිපුර ගෙවීමට සිදු වි තිබුණි. | ජාතික ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසියාකාරව අනුගමනය කළ යුතු බව | මෙම වර්ෂයේදී දිස්ත්‍රික්ක 24කට බලපෑ දැඩි වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් කළුතර, කෑගල්ල, මාතලේ, යාපනය යන දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ජල ටැංකි ලබාදෙන ලෙස ඉල්ලීම් සිදුකරන ලදි. ඒ වන විට ජල ටැංකි මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පැවති බැවින් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ කඩිනම් අවශ්‍යතාවය සලකා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ප්‍රසම්පාදන තීරණවල මිල ගණන් අනුව මිලදී ගැනීම සිදුකර ඇත. |

**3.3 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ------------------------- | ------------------ | ------------------------------------------ |
| චීන රජයේ පරිත්‍යාගයකින් කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා ලබාදී ඇති ජල බවුසර් 09ක් ඒවායේ විශාලත්වය නිසා අතුරු මාර්ගවල ධාවනය කිරීමට නොහැකි වීම, ක්‍රියාත්මක කිරීමේ හා නඩත්තු කිරීමේ අපහසුතා හේතුවෙන් නිෂ්ක්‍රීයව පැවතිණි. | ලොරි බවුසර් භාවිතය හා නඩත්තුව පිළිබඳ රියදුරන්ට පුහුණු වීම් ලබා දීම හා එම ලොරි බවුසර් ප්‍රයෝජනයට ගත හැකි ස්ථාන වලට යැවිය යුතු බව | ට්‍රැක්ටර් බවුසර් යොදාගැනීමේදී එහි ධාරිතාවය අඩු බැවින් වැඩි වාර ගණනක් බවුසරය ධාවනය කිරීමට සිදුවීම නිසා වැඩි වියදමක්ද දැරීමට සිදු වේ. මෙම ලොරි බවුසර් දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් නම්කර එවනු ලැබූ රියදුරන් දෙදෙනෙකු සඳහා බවුසර් හැසිරවීම පිළිබඳව කොළඹදී පුහුණුවීම් ලබාදෙන ලද බැවින් එම රියදුරන් මගින් දිස්ත්‍රික්කයේ අනෙකුත් රියදුරන් සඳහාද අදාළ පුහුණුවීම් ලබාදෙන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත දැනුම් දෙන ලදි. |

**3.4 කළමණාකරණ දුර්වලතා**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ------------------------ | ---------------- | ------------------------------------ |
| ගං වතුර නායයෑම් හා නායයෑම් අධි අවධානම් හේතුවෙන් තම පදිංචි ස්ථානයන්ගෙන් ඉවත් කරන පුද්ගලයින් නැවත පදිංචි කිරිම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ. | | |
| (අ) නැවත පදිංචි කිරිමේ මාර්ගෝපදේශයේ පියවර අංක 02 අනුව කමිටුවක් මගින් ප්‍රතිලාභින් තෝරාගැනිමට කටයුතු කර නොතිබුණ අතර, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නැවත පදිංචිකිරිමේ | නැවත පදිංචි කිරිමේ මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතු බව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් පිළිතුරු ලද පසු පිළිතුරු ඉදිරිපත් කරමි |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතිය සඳහා ලියාපදිංචි කරගෙන තිබූ ප්‍රතිලාභීන් 13 දෙනෙකු ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් නිකුත් කරනු ලැබූ භූ තාක්ෂණ වාර්තාවන් අනුව අවධානම් කලාපවල සිටින බව තහවුරු කර නොතිබුණි. | | |
| (ආ) | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 06 ක් සඳහා 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ප්‍රතිලාභීන් 91 ක් නැවත පදිංචි කිරීම වෙනුවෙන් රු.127,450,000 ක් ගෙවා තිබුණි. මෙම කාර්යය සඳහා වර්ෂ 03 ක් ගත වී තිබුණ ද 2020 ජනවාරි වන විට එම නිවාස වල පදිංචි නොවීම නිසා ජන ජීවිතය සුරක්ෂිත කිරීම සඳහා ආරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කිරීමේ කටයුතු සාර්ථකව ඉටුකර ගැනීමට නොහැකිවී ඇති බව නිරීක්ෂණය විය. | ජන ජීවිතය සුරක්ෂිත කිරීම සඳහා සුරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කිරීමේ කටයුතු සාර්ථකව කළ යුතු බව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් පිළිතුරු ලද පසු පිළිතුරු ඉදිරිපත් කරමි |
| (ඇ) | ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල දැඩි වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පීඩාවට ලක්වන ජනතාවට බෙදාදීමට ලබාදී තිබූ ජල ටැංකි 16ක් අරමුණට පරිබාහිර කාර්යයන් සඳහා යොදාගෙන තිබුණි. තවත් ජල ටැංකි 38ක හානි වීම්, ජල ටැංකි පිළිබඳ තොරතුරු නොවීම් නිරීක්ෂණය විය. | ප්‍රතිලාභීන් ප්‍රමුඛතා ලේඛන ගත කිරීම නිවැරදිකර ඒ අනුව කටයුතු කළ යුතු බව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් පිළිතුරු ලද පසු පිළිතුරු ඉදිරිපත් කරමි |

**4. යහපාලනය**

**4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| හදිසි ආපදා තත්වයන්ගෙන් විපතට පත් ජනතාවට සහන සැලසීම සඳහා විවෘත කළ බැංකු ගිණුමේ දේශීය හා විදේශීය පරිත්‍යාගශීලින්ගෙන් ලැබී තිබුණු ආධාරවලින් 2019 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 294.73 ක අරමුදලක් ගොඩනැගී තිබුණි. චීන රජයෙන් ඩොලර් මිලියන 1.00 පරිත්‍යාගයක් ද මීට ඇතුලත් විය. කෙසේ වෙතත් මෙම අරමුදල් ආපදා සහන සේවා කටයුතු සඳහා යොදාගැනීමට ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | පරිත්‍යාගශීලින්ගෙන් ලැබෙන ආධාර ඔවුන් පරිත්‍යාග කළ අරමුණු ලඟා කර ගැනිමට යෙදවිය යුතු බව | 2017 වර්ෂයේ ගංවතුර ආපදා තත්ත්වයෙන් නිවාස පූර්ණ හානියට පත්වූ පවුල් සඳහා නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ කළුතර හා රත්නපුර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන නියමු ව්‍යාපෘතිය සඳහා මෙම ආපදා සහන ගිණුමෙහි ඇති මුදල් යොදාගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශ ලේකම් හා Yapka Construction (Pvt) Ltd. යන චීන ඉදිකිරීම් සමාගම සමඟ ගිවිසුම්ගතව ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. |

**5. මානව සම්පත් කළමණාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආපදා කළමනාකරණ අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 114 ක් වුව ද 2019 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 81 ක් විය. මේ අනුව ජොෂ්ඨ කලමනාකරණ මට්ටමේ තනතුරු සමග පුරප්පාඩු 33 ක් පැවතුනි. | අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා බඳවා ගැනිම කළ යුතු බව | ආපදා කළමනාකරණ අංශයේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කර දෙන මෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ලිපි මඟින් දන්වා ඇත. 2020.06.17 දින වන විට ආපදා කළමනාකරණ අංශයේ පුරප්පාඩු සංඛ්‍යාව 31 ක් විය. |